සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## නාට්‍ය හා රංග කලාව - I

**නම/විභාග අංකය :-- ..................................................................................** **කාලය : පැය 03යි.**

- ♦ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ♦ අංක 01 සිට 40 දක්වා ප්‍රශ්වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

♦ **පහත සඳහන් පද්‍ය පාඨ ඇසුරෙන් 1 සිට 6 දක්වා ප්‍රශ්වලට පිළිතුරු සපයන්න.**

A මම් වගේ පේඩි කතක් මනා
දුටුවාද ලොවේ රූසිරෙන් දිනා
මව්පියෝ නිදහස් වෙන්න ටා
මාව දුන්නයි නාකි වූ හමෙකුටා

B ඇන්නෑවේ මේ මල කෝලම්
පාරෙ යන්නට බෑ මුන්දෑ සමගින්
මව්පියො නිදහස් වෙන්න සිතා බැඳ
දුන්නේය මා මේ අඟුටුමිටිය ටා

C පරසක්වල අපෙ මහ රජ්ජුරුවෝ
තෑගි කලයි කිරි පුස්සා
සරු බිම් හොයලා කම්මැලි වීලා
පැන්නුවායි කිරි පුස්සා

D ජටා හිස දරමින
සුද්ද අශ්ටක වැල්ද කරලන
කුඩය ගෙන සුරතින
මෙසේ බමුණෙක් සබේ නික්මුණ

E ගම්භිර තෙදැති කොන්ස්තන්තීනු පුරේ
කොන්ස්තන්තිනු පුරේ
පුරවර්ධන කරන අග නරනාමෙ මං
නාමය මං අලිසන්දරී

F සවන් දී පෙර රාම චරිතේ අසව්
පොරණ ලක්දිව උන්නු රාවණ
ආල වී ජානකී
ගෙන ගියේ තම රියේ

1. නාඩගම් සම්ප්‍රදායට අයත් නාට්‍ය ගීතයක් වන්නේ,
   1. A 2. B 3. E 4. F

2. කෝලම් චරිතයක් විසින් ගැයෙන කවියක් වන්නේ,
   1. A 2. B 3. C 4. D

3. රාමායණය නූර්තියට අයත් පද්‍ය කොටසක් වන්නේ,

1. A 2. B 3. F 4. D

4. පරාක්‍රම නිරිඇල්ලයන්ගේ නාට්‍යයක ඇතුලත් ගීත ඛණ්ඩය වන්නේ,

1. A 2. B 3. C 4. D

5. පුණ්‍යසේන ගුණසිංහයන්ගේ කාලගෝල නාට්‍යයට අයත් පද්‍ය කොටසක් ඇතුළත් වන්නේ,

1. A 2. B 3. C 4. D

6. වඩිග පටුන අන්තර් රංගයට අයත් වන්නේ,

1. A 2. B 3. C 4. D

7. නාට්‍ය පෙලෙහි චරිතවලට ගැලපෙන ලෙස නළු නිළියන් තෝරා ගැනීම,

1. කථා වින්‍යාසයයි
2. නළුවරණයයි
3. සවේශ පුහුණුවයි.
4. භූමිකා නිරූපණයයි

8. අභිරූපණ රංගනයක් සඳහා,

1. නරඹන්නන්ට මවාගත හැකි සිදුවීමක් නිරූපණය කළ යුතුය.
2. ඕනෑම සිදුවීමක් යොදා ගත හැකිය.
3. ඕනෑම අවස්ථාවක් යොදා ගත හැකිය.
4. වාචික අභිනය ද යොදාගත හැකිය.

9. රාත්‍රී කාලයේ සොහොන් භූමියක හොල්මන් දර්ශනයක් මැවීමට උපකාර වන්නේ,

1. ධාරාලෝක පහන්ය. 2. අල්ට්‍රා වයලට් පහන්ය. 3. චලනය වන යොමු පහන්ය. 4. වර්ණ චක්‍ර පහන්ය.

10. නාට්‍යයක් රඟ දැක්වෙන මොහොතේදී එහි සාර්ථකත්වයට අනිවාර්යයෙන්ම සිටිය යුත්තේ,

1. නාට්‍ය පෙල රචකයාය.
2. නාට්‍ය සංවිධායකවරයාය.
3. ප්‍රේක්ෂකයෝය.
4. නාට්‍යශාලා භාරකරුය.

11. රංග රචනයේදී (රංග වින්‍යාසය) සැලකිලිමත් විය යුත්තේ,

1. ප්‍රධාන චරිත, වේදිකාවේ ස්ථාන සහ චලන රටාය.
2. වේදිකා අවකාශය නළු නිළි චලන සහ ආනුශාංගික කලා පිළිබඳවය.
3. මැද වේදිකාව හා තිර පිළිබඳවය
4. ඉහළ මැද වේදිකාව හා පහළ මැද වේදිකාව පිළිබඳවය.

12. සිංහල හා ඉංග්‍රීසි වේදිකාව තුළ වඩාත් ප්‍රකට රංග වින්‍යාසකරුවෙක් වන්නේ,

1. රුවන්ති ද චිගේරාය 2. ඉන්දු ධර්මසේනය. 3. ෆේරෝස් කමලඩීන්ය. 4. ජෙරම් ද සිල්වාය.

13. රූපණ ශිල්පියකුට දෑස්වල සබඳතාව පවත්වා ගැනීම ඉතා වැදගත්ය. මේ සඳහා ප්‍රගුණ කළ යුතු අභ්‍යාසයකි.

1. ශිථිලීකරණ අභ්‍යාස 2. තාපන අභ්‍යාස 3. සංවේදන අභ්‍යාස 4. දර්පන අභ්‍යාස

14. නළුවකුට දීර්ඝ සංවාද ඛණ්ඩ නිවැරදිව හා පැහැදිලිව උච්චාරණය කිරීමට උපකාරී වන්නේ,

1. ශිථිලීකරණ අභ්‍යාස 2. ශ්වසන අභ්‍යාස 3. සංවේදන අභ්‍යාස 4. චිත්ත ඒකාග්‍රතාව අභ්‍යාස

15. කෙටි නාට්‍යයක් යනු,

1. දිගු නාට්‍යයක ජවනිකා කෙටිකර පෙන්වීමකි.
2. දිගු නාට්‍යයක ජවනිකා අඩුකර පෙන්වීමකි.
3. ඒකාංක නාට්‍යකි.
4. චරිත දෙකක් පමණක් ඇති නාට්‍යයකි.

16. පත්තිනි පූජාව මුල්කොට ගෙන රඟ දැක්වූ ගැමි නාට්‍යය වන්නේ,

1. කෝලම්ය. 2. සොකරිය. 3. පාස්කුය. 4. නාඩගම්ය.

17. නාට්‍යයක අත්‍යවශ්‍ය අංගත්‍රය වන්නේ,

1. අධ්‍යක්ෂවරයාය, පෙළ හා නළුවෝය.
2. නාට්‍ය පෙල, නළුවන් හා ප්‍රේක්ෂකයෝය.
3. අධ්‍යක්ෂවරයාය, ආනුශාංගික ශිල්පීන් හා නළුවෝය.
4. නාට්‍ය පෙළ, සංගීතය හා ප්‍රේක්ෂකයෝය.

18. ලෝකප්‍රකට හංසවිල (Swan Lake) අයත් වන්නේ කුමන නාට්‍ය ගණයට ද?
1. බැලේ 2. ඔපෙරා 3. මුද්‍රානාට්‍ය 4. ගීත නාටක

19. කොහොඹා කංකාරියට අයත් නොවන පෙල පාලිය වන්නේ,
1. අඹවිදමන 2. ගුරුගේ මාලාව 3. ඌරායක්කම 4. ගබඩාකොල්ලය

20. රූකඩ නටවන ශිල්පියා
1. පොතේගුරුය 2. අන්නවිරාළය 3. සූත්‍රධාරය 4. සබේවිදානේය

21. ප්‍රේක්ෂක ප්‍රතිචාර මත වෙනස් කළ නොහැකි කලාංගය වන්නේ,
1. නර්තනයයි 2. චිත්‍රපටයයි 3. නාට්‍යයි 4. වාදනයයි

22. වේදිකා නාට්‍යයක රංගාලෝක පහන්වල ආලෝකය පාලනය කරන උපකරණය
1. බබල් මැෂින් එක වේ. 2. ප්‍රක්ෂේපණ යන්ත්‍රය වේ. 3. ඩිමරය වේ. 4. වර්ණ චක්‍රය වේ.

23. නාට්‍යක වේෂ භූෂණ ඉටු නොකරන කාර්ය වන්නේ,
1. චරිතයට පිවිසීමය. 2. ප්‍රේක්ෂකයාට චරිතය හඳුනා ගැනීමය.
3. නාට්‍යයේ ශෛලිය පෙන්වීමය. 4. චරිත බාහිරව සුන්දර කිරීමය.

24. වේෂ භූෂණය
1. කෙටි නාට්‍ය හා දිගු නාට්‍ය අනුව වෙනස් වේ.
2. නාට්‍ය ධර්මී හා ලෝකධර්මී අනුව වෙනස් වේ.
3. ප්‍රධාන නළුවන් හා අප්‍රධාන නළුවන් අනුව වෙනස් වේ.
4. ඉදිරිපත් කරන රංග භූමි වර්ගයට අනුව වෙනස් වේ.

25. වේදිකා නාට්‍යක සංගීතය සම්බන්ධ වැරදි ප්‍රකාශය වන්නේ,
1. රසෝත්පාදනයට ඉවහල් විය යුතුය
2. පිටපතට අනුව අවශ්‍ය නම් පමණක් භාවිතා කළ යුතුය.
3. තේමාවට උචිත ලෙසින් භාවිත කළ යුතුයි
4. සංගීත අධ්‍යක්ෂවරයාට සිතෙන ආකාරයට නිර්මාණය විය යුතුය.

26. සංගීතය යොදා නොගත් නාට්‍යක් වන්නේ,
1. තලමල පිපිලා නාට්‍යය 2. කැලණි පාලම නාට්‍යයි 3. කතන්දර දෙකක් නාට්‍යයි 4. ඊඩිපස් නාට්‍යයි

27. රංග භූමි අලංකරණය සිදු නොකරන්නේ,
1. ජීවමාන නළුවන් මගිනි 2. සිමෙන්ති, යකඩ, ගඩොල් යොදා ගනිමිනි
3. චිත්‍ර, වස්ත්‍ර මගිනි 4. ස්ලයිඩ් (වර්ණ විනිවිදක) මගිනි

28. රංග භූමිය රංග භූමි අලංකරණයේදී සැලකිලිමත් වීමට අවශ්‍ය නොවන්නේ.
1. රංග ශෛලිය පිළිබඳවය 2. නාට්‍ය පෙළෙන් කියවෙන කාලය යුගය පිළිබඳවය
3. පරිහරණය කිරීමේ පහසුව පිළිබඳවය 4. ප්‍රධාන නළු නිළියන්ගේ රංගන ස්වභාවය පිළිබඳවය

29. ප්‍රේක්ෂක ප්‍රතිචාර සම්බන්ධව වැරදි ප්‍රකාශය තෝරන්න.
1. නාට්‍යයක් තක්සේරු කිරීමට හේතු වේ. 2. නළු නිළියන්ගේ රංගනය දුර්වල කරයි.
3. නාට්‍යයේ ඉදිරි ගමනට හේතු වේ. 4. යනු නාට්‍යය පිළිබඳ විචාරයකි.

30. ක්ෂණික නිරූපණය නළුවාට වඩාත් ප්‍රයෝජනවත් වන්නේ,
1. රංග අභ්‍යාසවලදී 2. සංවිධානගත නාට්‍ය රංගනයකදී
3. නාට්‍ය වැඩමුළුවකදී 4. ප්‍රසංග වේදිකාවේදී

31. අභිරූපණය පුහුණු වීමේදී භාවිත කරන ගමන් රටාවක් වන්නේ,
1. සරල ගමන 2. පැති ගමන 3. වේගවත් ගමන 4. අමාරු ගමන

32. නාට්‍යක දී කථාව හා ක්‍රියාව ප්‍රේක්ෂකයා අවබෝධ කරගන්නේ,
1. පිටපත මගින් 2. තේමාව මගින් 3. චරිත නිරූපණය මගින් 4. අධ්‍යක්ෂණය මගින්

33. නාට්‍යමය අවස්ථාවක් ගොඩනැගෙන්නේ,

1. ගැටුමක් නිසා ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලියක් පැවතීමෙන් 2. ප්‍රධාන චරිතය රඟපාන අවස්ථාවකින්

3. තේමාව ප්‍රකාශ වන අවස්ථාවකින් 4. අවස්ථා රැසක් එකතු වීමෙන්.

34. හුණුවටය කතාව නාට්‍යයේ රචකයා වන්නේ,

1. හෙන්රි ජයසේන 2. මානෙල් ජයසේන 3. බර්ටෝල් බ්‍රෙෂ්ට් 4. හෙන්රික් ඉබ්සන්

35. කාලගෝල නාට්‍ය සඳහා මුල් වූයේ,

1. කාලගෝල ප්‍රශ්නය නම් කථා වස්තුවයි. 2. උම්මග්ග ජාතකය නම් කතා වස්තුවයි.

2. මහෞෂධ පණ්ඩිතයන්ගේ කථා වස්තුවයි 4. දික්තල කාලගෝල කථා වස්තුවයි

♦ **පහත ඡායාරූප ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**


A


B


C


D


E

36. රොමියෝ ජුලියට් නම් ප්‍රකට නාට්‍ය රචකයා දැක්වෙන්නේ,

1. B අක්ෂරයෙන් 2. A අක්ෂරයෙන් 3. E අක්ෂරයෙනි 4. D අක්ෂරයෙනි.

37. E අක්ෂරයෙන් දැක්වෙන ඡායාරූපය,

1. තලමල පිපිලා නාට්‍යයේය 2. මෝදර මෝල නාට්‍යයේය

3. ගුරු තරුව නාට්‍යයේ 4. කපුවා කපෝති නාට්‍යයේ

38. B අක්ෂරයෙන් දැක්වෙන ඡායාරූපයේ සිටින කලාකරුවා නිරත නොවූයේ

1. රංගනයේය 2. සංගීතයේය 3. නවකථා රචනයේය 4. නාට්‍ය අධ්‍යක්ෂණයේය

39. C අක්ෂරයෙන් දැක්වෙන්නේ,

1. නාඩගම් රංග භූමියයි 2. මිනර්වා රංග භූමියය

3. ග්‍රීක රංග භූමියයි 4. කෝලම් රංග භූමියයි

40. "ගුවන් විදුලි රඟමඬල" වැඩසටහන්වලට දායකත්වය දැක්වූ ශිල්පියා/ ශිල්පිනිය

1. A ඡායාරූපයේ සිටී. 2. B ඡායාරූපයේ සිටී

3. D ඡායාරූපයේ සිටී. 4. E ඡායාරූපයේ සිටී.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## නාට්‍ය හා රංග කලාව II

**නම/විභාග අංකය :-- .................................................................................... කාලය : පැය 2 යි.**

**පළමු ප්‍රශ්නය අනිවාර්ය ය, තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

1. ''ඒ ඔක්කොම පිළිවෙල ඉවරයි. මේ ගමන විහාගේ පාස් උනේ නැත්නම් මට හරියට හිතෙනව අපි නැටුම් ගැයුම්වලට ඉඩ දුන්න වැඩියි කියල''

    i. මෙම සංවාද ඛණ්ඩය අයත් වන නාට්‍ය සහ එහි කතෘ නම් කරන්න.

    ii. එම නාට්‍යය අයත් වන්නේ කවර ගණයේ නාට්‍ය වර්ගයකට ද?

    iii. මෙම නාට්‍යයේ ප්‍රධාන චරිතය නම් කරන්න.

    iv. එම චරිතය දක්ෂතා දක්වන ක්ෂේත්‍ර 2 ක් නම් කරන්න.

    v. ප්‍රධාන චරිතය හැරුණු කොට නාට්‍ය තුළ කැපී පෙනෙන තවත් චරිත 2 ක් නම් කරන්න.

    vi. නාට්‍ය අවසානයේදී ප්‍රධාන චරිතය කුමන තත්ත්වයකට පත් වේ ද?

2. i. උඩරට ප්‍රදේශයට ආවේණික ශ්‍රී ලංකාවේ පැරණිතම ජන නාටකය සඳහන් කරන්න. (ල.2)

    ii. එම ජන නාටකය පැවැත්වීමේ අරමුණු 2 ක් සඳහන් කරන්න. (ල.4)

    iii. එයින් ප්‍රකාශිත කතා පුවත කෙටියෙන් ලියා දක්වන්න. (ල.6)

3. i. වේදිකා නාට්‍යයක දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ 2 ක් සඳහන් කරන්න. (ල.2)

    ii. එහි ප්‍රාසාංගිකත්වය වර්ධනය කිරීමට භාවිත කරන ආනුෂාංගික අංග 4 ක් සඳහන් කරන්න (ල.4)

    iii. වේදිකා නාට්‍යයක් සහ රූපවාහිනී නාට්‍යයක් අතර ඇති වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.6)

4. i. රූපණය යනු කුමක් ද? (ල.2)

    ii. අතීතයේදී රූපණ කාර්ය ඉදිරිපත් කරන ලද ස්ථාන 3 ක් සඳහන් කරන්න. (ල.4)

    iii. වර්තමානයේ රූපණ කාර්යය ඉදිරිපත් ස්ථාන පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල.6)

5. i. වේදිකා නාට්‍යයක සංවාද භාවිත කිරීමේ ප්‍රධානතම ක්‍රම 2 ලියන්න (ල.2)

    ii. ඒ සඳහා නිදර්ශන කර දැක්විය හැකි නාට්‍ය කෘති 2 බැගින් ලියන්න (ල.4)

    iii. එම කොටස් දෙකෙහි විශේෂ ලක්ෂණ 3 බැගින් සඳහන් කරන්න. (ල.6)

6. i. පහතරට ප්‍රදේශවල ප්‍රචලිතව පවතින ශාන්තිකර්ම 3 ක් සඳහන් කරන්න. (ල.2)

ii. එම ශාන්තිකර්මවල දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ 4 ක් සඳහන් කරන්න. (ල.4)

iii. එයින් එක් නාට්‍යමය ලක්ෂණයක් පහතරට ශාන්තිකර්මයක ඇතුළත් වී ඇති අයුරු කෙටියෙන් විස්තර කරන්න. (ල.6)

7. චතුරංග විවාහ මංගල්‍යයක් සඳහා යමින් සිටින අතර එක වරම ඔහුගේ මෝටර් රථය පාරේ නවතී. නැවත එන්ජිම පණ ගැන්වීමට නම් මෝටර් රථය තල්ලු කළ යුතු වේ. ඔහු මේ සඳහා අසල සිටින කිහිප දෙනෙකුට කතා කර කාරය තල්ලු කිරීමට සූදානම් වේ.

මෙතැන් සිට සිදුවන දේ පදනම් කරගෙන කෙටි නාට්‍ය පිටපතක් රචනා කරන්න.

i. නිවැරදිව සංවාද සහ රංග විධානවලින් සමන්විතව පෙළ රචනයට (ල.4)

ii. නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි රචනා වී තිබීමට (ල.8)

**Answer**

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 11 ශ්‍රේණිය
## නාට්‍ය හා රංගකලාව - පිළිතුරු පත්‍රය

i පත්‍රය

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. 3 | 2. 2 | 3. 3 | 4. 3 | 5. 2 | 6. 4 | 7. 2 | 8. 1 | 9. 2 | 10. 3 | 11. 2 | 12. 4 | 13. 4 | 14. 2 |
| 15. 3 | 16. 2 | 17. 2 | 18. 1 | 19. 1 | 20. 3 | 21. 2 | 22. 3 | 23. 4 | 24. 2 | 25. 4 | 26. 2 | 27. 2 | 28. 4 |
| 29. 2 | 30. 2 | 31. 2 | 32. 3 | 33. 1 | 34. 3 | 35. 1 | 36. 4 | 37. 1 | 38. 2 | 39. 4 | 40. 1 | | |

## II කොටස

1. i. විකෘති නාට්‍යය, සෝමලතා සුබසිංහ
   ii. යොවුන් නාට්‍ය වර්ගය
   iii. ප්‍රියංගනී
   iv. නර්තන ක්ෂේත්‍රය, ක්‍රීඩා ක්ෂේත්‍රය
   v. හිල්ඩා, සම්පත්, සරණපාල, සුසිලා, කරුණාරත්න, ජගත්
   vi. උමතු ස්වභාවයකට / පිස්සු තත්ත්වයකට / මානසික ආබාධ තත්ත්වයකට

2. i. සොකරි
   ii. විනෝදාස්වාදය ඵලදාව සශ්‍රීකත්වය හා සෞභාග්‍යය
   iii. සොකරි ජන නාටකය හා සම්බන්ධ කථා ප්‍රවෘත්තිය කෙටියෙන් ලියා තැබීම.
   (ගුරු අත්පොතෙහි ඇති කථාව හෝ ඊට සමාන කථා පුවතක්)

3. i. සජීවීබව, සතර අභිනය භාවිතය නළු ප්‍රේක්ෂක සම්බන්ධතාව
   ii. රංගාලෝකය රංග භාණ්ඩ වේශභූෂණය පසුතල සංගීතය නර්තනය
   iii.
   - වේදිකා නාට්‍යය සජීවී වන අතර රූපවාහිනී නාට්‍ය සජීවී නැත.
   - වේදිකා නාට්‍යයක් නිශ්චිත මොහොතක සම්පූර්ණයෙන් ම වේදිකාගත වේ. රූපවාහිනී නාට්‍යයක් කොටස් වශයෙන් විකාශය වේ.
   - වේදිකා නාට්‍යයක් වේදිකාව මත ප්‍රදර්ශනය වන අතර රූපවාහිනී නාට්‍යයක් රූපවාහිනිය මගින් ප්‍රදර්ශනය වේ.
   - වේදිකා නාට්‍යයක සීමිත පසුතල කිහිපයක් රංග භූමිය මත නිර්මාණය කරන අතර රූපවාහිනී නාට්‍යයක සැබෑ ම වූ විවිධ පසුතල මත රංගනය ඉදිරිපත් වේ.
   - වේදිකා නාට්‍යයක සජීවී ප්‍රේක්ෂක නළු සම්බන්ධතාව ගොඩනැගේ. රූපවාහිනී නාට්‍යයක එවන් සජීවී සම්බන්ධයක් නැත.
   - වේදිකා නාට්‍යයක වස්තු කාලය හා රංග කාලය කෙටි වුව ද රූපවාහිනී නාට්‍යයක වස්තු කාලය හා රංග කාලය දීර්ඝ වේ.

   යනාදී වශයෙන් වූ වෙනස්කම් 3 ක් විස්තර කර තිබීම (ල.6)

4. i. චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සීමාවක් එහි ජීවත් වීම නළු කාර්යය රූපණය නම් වේ. යන අදහසට සමාන අදහසක් ලියා තිබීම
   ii. ගිනිමැල භූමිය යාග භූමිය තානායම්පොළ පූජා භූමිය කමත කරලිය
   iii. වර්තමානයේ රූපන කාර්ය ඉදිරිපත් කරන්නේ ප්‍රොසීනියම වේදිකාවකය. ප්‍රොසීනියම් වේදිකාව ගැන විස්තර කිරීම අවශ්‍ය වේ.

5. එක් මාතෘකාවක් සඳහා ලකුණු 5 බැගින්

  i. නාට්‍ය ධර්මී ක්‍රමය
     ලෝක ධර්මී ක්‍රමය
  ii. නාට්‍ය ධර්මී සඳහා - මනමේ, සිංහබාහු, නරිබෑනා, කාලගෝල
     ලෝක ධර්මී සඳහා - කැලණි පාලම, තලමල පිපිලා, කපුවා කපෝති
  iii. නාට්‍ය ධර්මී සම්ප්‍රදායේ ලක්ෂණ 3 ක් සහ ලෝකධර්මී සම්ප්‍රදායේ ලක්ෂණ 3 ක් ලියා තිබීම

6. එක් මාතෘකාවක් සඳහා ලකුණු 5 බැගින්

  i. සන්නි යකුම    රට යකුම    සූනියම් ශාන්තිය    මහසොහොන් සමයම    ගම්මඩු, දෙවොල් මඩු
  ii. අනුකරණය, සංවාද භාවිතය, සමාරෝපණය, අවවස්ථා නිරූපණය, අනුරූපණය, ප්‍රේක්ෂක සහභාගීත්වය, රංග භාණ්ඩ යන ආදී වූ ලක්ෂණවලින් 4 ක් නම් කිරීම
  iii. ii හි නාට්‍යමය ලක්ෂණයක් i හි සඳහන් ශාන්තිකර්මය ඇතුළත් වී ඇති අයුරු විස්තර කර තිබීම

7. i. සම්මත පිටපතක් මෙන් චරිත සහ සංවාද වෙවන් කොට රංග විධාන ද සහිතව පෙළ රචනා කිරීම සඳහා
  ii. නාට්‍යෝචිත භාවයන් ගොඩනැගන පරිදි අවස්ථා 1 ක් හෝ 2 කින් (නාට්‍ය අංක 1 ක් හෝ 2 ක්) කථාව රචනා වීමට

  අවස්ථා 2 කට වැඩිවන විට (නාට්‍ය අංක 2 කට) ලකුණු ප්‍රමාණය අඩු කළ යුතුය